# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1719/24 - 2011 අගෝස්තු 18 වැනි බ්‍රහස්පතින්දා - 2011.08.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරිය)**

විනිමය පාලන පනතේ 7 සහ 31 වගන්ති යටතේ අවසරය

(i) අනේවාසික ශ්‍රී ලාංකිකයන්ට හිමි, ශ්‍රී ලංකාව තුළ පිහිටි දේපළ මිලදී ගැනීමේදී එම ප්‍රතිෂ්ඨාව ශ්‍රී ලංකා මුදලින් අනේවාසික ශ්‍රී ලාංකිකයන්ට ගෙවීමක් හෝ බැර කිරීමක් ශ්‍රී ලංකාවේ දී කිරීමට, පහත (ii) උපඡේදයේ දක්වා ඇති පරිදි එම සියලු ගෙවීම් අනේවාසික විදේශිකයන්ගේ නමින් ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙඳුන් සමග විවෘත කරන ලද "අනේවාසික සංවෘත ගිණුමට" බැර කිරීමේ කොන්දේසියට යටත්ව, විනිමය පාලන පනතේ 7(අ) උපවගන්තිය යටතේ ඕනෑම පුද්ගලයෙකුට මෙයින් අවසර දෙනු ලැබේ.

(ii) ශ්‍රී ලංකාවේ පිහිටි තමන්ට හිමි දේපළ විකුණන අනේවාසික ශ්‍රී ලාංකිකයන්ගේ නමින් සංවෘත ගිණුම් ආරම්භ කිරීම සඳහා විනිමය පාලන පනතේ 31 වගන්තිය යටතේ බලයලත් වෙළෙඳුන් හට මෙයින් අවසරය දෙනු ලැබේ. කෙසේ වෙතත් එම සංවෘත ගිණුම්වලින් බාහිර ප්‍රේෂණ කිරීම් වරින්වර විනිමය පාලකවරයා විසින් නිකුත් කරනු ලබන විධානයන්හි සඳහන් නියමයන්ට අනුකූලව විය යුතුය.

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,
**විනිමය පාලක.**

2011 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

09-102

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 14955— 350 (2011/08)